# Galle Heritage Emporium - Block E

## වෙළඳකුටිය වසර 05ක කාලයක් සඳහා
## මාසික බදු පදනමින් ලබාදීම

# ලංසු සඳහා ආරාධනාවයි

### බුද්ධශාසන, ආගමික හා
### සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

GALLE HERITAGE FOUNDATION

## ගාලු උරුමය පදනම

**ටෙන්ඩර් අංකය GHF/PR/NCB/2026/001**

01. බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ, ගාලු උරුමය පදනම විසින් ගාල්ල කොටුව පල්ලිය වීදියේ පිහිටි සංරක්ෂණය කරන ලද අලෙවි කුටි 07 කින් යුත් Galle Heritage Emporium ගොඩනැගිල්ලේ Block E වෙළඳ කුටිය දෙස් විදෙස් සංචාරක අවශ්‍යතා ඉටුකිරීම ඉලක්ක කර ගාල්ල කොටුවේ ආර්ථිකයට අගය එකතු කරමින් හා ගොඩනැගිල්ලේ පෞරාණික උරුම අගය ආරක්ෂා කර ගනිමින් සිදුකරන පසුභාවිතාවක් සඳහා සුදුසු ව්‍යාපාරිකයින්ගෙන් හෝ ව්‍යාපාර ආයතන වලින් ජාතික තරඟකාරී ලංසු ක්‍රියාවලිය අනුව ලංසු කැඳවනු ලැබේ.

02. බදු කාලසීමාව වසර 05 කි.

03. මාසිකව අපේක්ෂිත අවම බදු වටිනාකම රුපියල් ලක්ෂ දෙකකි (රු. 200,000) වේ.

04. සියලුම ලංසු **2026.06.02** දින දක්වා වලංගු විය යුතුවේ. (එනම් ලංසු භාර ගැනීම අවසන් කල දින සිට දින 91).

05. මේ පිළිබඳ උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට, සිංහල භාෂාවෙන් සකස් කරන ලද සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් ආපසු නොගෙවන රුපියල් පන්දහසක (රු.5,000/-) ගාස්තුවක් ගෙවා ගාලු උරුමය පදනමේ ගිණුම් අංශයෙන් **2026.02.27** වන දින දක්වා වැඩ කරන දිනයන් තුළ පෙ.ව. 9.00 ත් ප.ව. 3.00 ත් අතර, ලිඛිත ඉල්ලීමක් කර ලබා ගත හැකිය. එක් ලංසු ලේඛන කට්ටලයක් තුළින් එක් වාණිජ භාවිතාවක් සඳහා පමණක් ලංසු ඉදිරිපත් කළ හැකිවේ.

06. පූර්ව- ලංසු රැස්වීම **2026.02.18** වන දින **ප.ව. 2.00**ට අංක 12, රැම්පාට් වීදිය, කොටුව, ගාල්ල යන ලිපිනයේ පිහිටි ගාලු උරුමය පදනම ප්‍රධාන කාර්යාලයේ දී පැවැත්වේ.

07. අධ්‍යක්ෂ, ගාලු උරුමය පදනම නමට පිළිගත් වාණිජ බැංකුවකින් ලබාගත් රුපියල් **හැත්තෑදෙදහසක් (රු. 72,000/-)** වටිනා කොන්දේසි විරහිත ලංසු සුරක්ෂණයක් (ලංසු සුරක්ෂණය ගිණුම් අංශය වෙත මුදලින් ද තැන්පත් කළ හැකිය) ඉදිරිපත් කළ යුතු අතර, එය **2026.06.30** දින දක්වා වලංගු විය යුතුවේ.

08. සියළුම ලංසු ඉහත සඳහන් පරිදි ලංසු සුරක්ෂණය සහ ගාලු උරුමය පදනමේ ගිණුම් අංශය වෙත ආපසු නොගෙවන ලංසු ගාස්තුව ගෙවා ලබා ගන්නා ලද ලදුපතෙහි ඡායා පිටපතක් සමඟ ඉදිරිපත් කළ යුතුය.

09. නිසිලෙස සම්පූර්ණ සහ මුද්‍රා තබන ලද ලංසු, මුල් පිටපත සහ අනු පිටපත ලෙස වෙන් වෙන්ව ලියුම් කවරවල බහා ආවෘත කොට, එම පිටපත් දෙකම එකම කවරයක බහා මුද්‍රා කර ලංසු භාරගන්නා අවසන් දිනට හා වේලාවට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් **සභාපති, අමාත්‍යාංශ සුළු ප්‍රසම්පාදන කමිටුව, ගාලු උරුමය පදනම, අංක 12, රැම්පාට් වීදිය, කොටුව, ගාල්ල**ට යොමු කිරීමෙන් හෝ ගාලු උරුමය පදනමේ ගිණුම් අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට පෞද්ගලිකව පැමිණ බහාලීම සිදුකළ හැකිය. ප්‍රමාද වී ලැබෙන හෝ අසම්පූර්ණ ලංසු කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු පත්‍ර බහා එවන කවරයේ ඉහළ වම් කෙළවර **"Galle Heritage Emporium - Block E වෙළඳ කුටිය වසර 05ක කාලයක් සඳහා මාසික බදු පදනමින් ලබාදීම"** යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය.

10. ලංසු භාර ගැනීමේ අවසාන දිනය **2026.03.03 ප.ව. 2.30** වේ. සියළුම ලංසු, ලංසු භාර ගැනීම අවසන් වූ වහාම ඉහත ලිපිනයේ දී විවෘත කරනු ලැබේ. එම අවස්ථාවට ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ට සහභාගි විය හැකිය.

11. මේ පිළිබඳ වැඩි විස්තර ගාලු උරුමය පදනමේ ගිණුම් අංශයෙන් (දුරකථන අංක **091-2246784**) සතියේ වැඩකරන දිනවල **පෙ.ව.9.00 සිට ප.ව. 3.00** දක්වා ලබා ගත හැකිය. මෙම බදුදීම පිළිබඳව සියලු කරුණු සම්බන්ධයෙන් ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

**සභාපති ,**
**අමාත්‍යාංශ සුළු ප්‍රසම්පාදන කමිටුව,**
**බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය (ජාතික උරුම අංශය),**
**සෙත්සිරිපාය -2 අදියර, බත්තරමුල්ල.**

**දුරකථන - 0912246784**
**ඊ මේල් - herifo@sltnet.lk**
**වෙබ් අඩවිය - www.galleheritage.gov.lk**